සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

www.alpanthiya.lk

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

**23 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

- අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**1.** දේශපාලනය
A - බලය සඳහා කරනු ලබන අරගලය ලෙස සැලකේ.
B - සමාජ, ආර්ථික සහ දේශපාලන ගැටලු පිළිබඳ නොඑකඟතාවන්හි ප්‍රතිඵලය වේ.
C - ප්‍රශ්නාර්ථගත ගැටලු විසඳීමට රාජ්‍ය බලය යෙදවීම හා සම්බන්ධ වේ.
D - මහත්වරුන් විසින් පමණක් රඟ දක්වන ක්‍රීඩාවක් ලෙස සැලකේ.
E - අධිකාරී බලය භාවිත කරමින් අගය කිරීම් බෙදා හැරීම පිළිබඳ ක්‍රීඩාව වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**2.** දේශපාලන විද්‍යාව
A - රාජ්‍යය, ආණ්ඩුව සහ දේශපාලනය පිළිබඳ හැදෑරීම හා සම්බන්ධ විෂය වේ.
B - මිනිස් ජීවිතයේ ආරම්භය, පැවැත්ම සහ අවසානය අධ්‍යයනය කිරීම හා සම්බන්ධ විෂය වේ.
C - දර්ශනය, චින්තනය, න්‍යාය සහ මතවාද යන සිව්වැදෑරුම් අංශවලින් සමන්විත වේ.
D - සමාජීය විද්‍යාවක් ලෙස පොදුවේ පිළිගනු ලැබේ.
E - න්‍යායාත්මක දේශපාලනය සහ ප්‍රායෝගික දේශපාලනය යන දෙඅංශයෙන් සමන්විත වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**3.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ
A - දේශපාලන කාරණා පිළිබඳව තාර්කික අගය විනිශ්චය කිරීම්වලට එළඹීම සඳහා ය.
B - දේශපාලන භූමිකා ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ය.
C - තමන් අකමැති පුද්ගලයන්ට මඩ ගැසීම සහ ඔවුන්ගේ චරිතය ඝාතනය කිරීම සඳහා ය.
D - දේශපාලන, පරිපාලන සහ රාජ්‍යතාන්ත්‍රික ක්ෂේත්‍රවල ප්‍රභූද්ධත්වය අයත් කරගැනීම සඳහා ය.
E - පුරවැසි යුතුකම් සහ වගකීම් උපරිම හැකියාවකින් ඉටු කිරීමට හැකිවන නිසා ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**4.** රාජ්‍යය
A - අනෙකුත් සියලුම සමාජ සංවිධාන අතුරෙන් ඉහළම සංවිධානය ලෙස සැලකෙන මානව ප්‍රජාව වේ.
B - ස්වාධිපත්‍ය බලය ලෙස හැඳින්වෙන උත්තරීතර අධිකාරී බලයේ පරම හිමිකරුවා වේ.
C - ජාතීන් අතර දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවා වේ.
D - එයටම අනන්‍ය වූ නිල නාමයකින්, ජාතික ගීයකින් හා ජාතික කොඩියකින් සමන්විත දේශපාලන සංවිධානයක් වේ.
E - ආණ්ඩුවේ දේශපාලන හස්තය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[දෙවැනි පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

5. ආණ්ඩුව
   A - ජාතික මට්ටමෙන් ඒකීය හෝ සන්ධීය පදනම මත සංවිධානය කරනු ලැබේ.
   B - රාජ්‍යයේ බලය සහ කාර්ය ඉටුකිරීමේ වගකීම පැවරී ඇති රාජ්‍ය සේවකයා වේ.
   C - රාජ්‍යය නමැති නෞකාවේ සුක්කානම හසුරුවන්නා වේ.
   D - රාජ්‍යයේ භූමිය තුළ ජීවත්වන සමස්ත ජනතාවගෙන්ම සමන්විත මානව ප්‍රජාව වේ.
   E - ප්‍රජාතන්ත්‍රවාදී හෝ විප්ලවීය මාර්ග හරහා ජනතාවට වෙනස් කළ හැකි දේශපාලන ආයතනයක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

6. ඒකීය ආණ්ඩුව
   A - භූගෝලීය වශයෙන් ඒකරාශී වී සිටින සුළු ජනකොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ඇති හොඳම ආණ්ඩුක්‍රමය ලෙස සැලකේ.
   B - ඒක බල කේන්ද්‍රයකින් පමණක් සමන්විත ආණ්ඩුක්‍රමයක් වේ.
   C - කුඩා භූමි ප්‍රදේශයක් සහිත රාජ්‍යවලට හෝ සජාතීය සමාජ සහිත රාජ්‍යවලට හෝ වඩාත් යෝග්‍යයැයි සැලකේ.
   D - ඒකීය පරිපාලන ක්‍රමයක්, ඒකීය අධිකරණ ක්‍රමයක් සහ ඒකීය පුරවැසිභාවයක් යන ගුණාංගවලින් යුක්ත වේ.
   E - කාර්යක්ෂමතාවයෙන් වැඩි සහ ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු ආණ්ඩුක්‍රමයක් ලෙස පොදුවේ පිළිගනු ලැබේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

7. සන්ධීය ආණ්ඩුක්‍රමය
   A - තල දෙකක ආණ්ඩුවලින් යුත් ආණ්ඩුක්‍රමයක් වේ.
   B - මධ්‍යය සහ පරිධිය අතර සිරස් බල පංගුකාරිත්වය පදනම් කරගෙන ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමයක් වේ.
   C - සමාජ බහුවිධතාව ආරක්ෂා කරමින් ඒකීයත්වය ළඟාකරගත හැකි හොඳම ආණ්ඩුක්‍රමය ලෙස සැලකේ.
   D - කුඩා ජනගහනයකින් සහ කුඩා භූමි ප්‍රදේශයකින් යුත් රාජ්‍යවලට වඩාත් යෝග්‍ය ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
   E - 1789 දී ස්ථාපිත කළ ඇමෙරිකානු ව්‍යවස්ථාව මගින් දේශපාලන ලෝකයට දායාද කළ ආණ්ඩුක්‍රම ආකෘතියක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

8. කැබිනට් ආණ්ඩුක්‍රමය
   A - පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ලෙස ද හැඳින්වේ.
   B - බලතල බෙදීමේ මූලධර්මය මත ගොඩනගා ඇත.
   C - විධායකය, නාමික සහ සත්‍ය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ.
   D - සෘජුව තෝරාපත් කරගන්නා ව්‍යවස්ථාදායකය සහ ඒ තුළින් තෝරා ගන්නා විධායකයකින් යුක්ත වේ.
   E - ජනාධිපති ආණ්ඩුක්‍රමය හා සසඳන විට ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් වැඩි වුවද කාර්යක්ෂමතාවයෙන් අඩු වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

9. ජනාධිපති ආණ්ඩුක්‍රමය
   A - 1958 දී ප්‍රංශයේ ස්ථාපිත කරන ලද පස්වන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ආකෘතියකි.
   B - ජනතාව විසින් සෘජුව හෝ වක්‍රව තෝරාපත් කරන ජනාධිපති නමින් හඳුන්වන විධායකයක් විසින් නායකත්වය දරනු ලැබේ.
   C - වඩාත් කාර්යක්ෂම වුවද, ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු යැයි සැලකේ.
   D - බලතල බෙදීමේ මූලධර්මය මත ගොඩනගා ඇත.
   E - හදිසි අවස්ථාවක් සඳහා වඩාත් යෝග්‍යයැයි සැලකේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය
   A - 1958 දී ප්‍රංශයේ ඩිගෝල් සෙනෙවියා විසින් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ආකෘතියකි.
   B - කැබිනට් සහ ජනාධිපති ආණ්ඩුක්‍රමවල මූලික මූලධර්ම එකට එක්කොට ගොඩනගා ඇත.
   C - ජනාධිපති සහ කැබිනට් මණ්ඩලයක් සහිත ද්විත්ව විධායකයකින් යුක්ත වේ.
   D - ක්‍රියාත්මක වන්නේ ජනාධිපතිගේ නායකත්වය යටතේ ය.
   E - ඒක පක්ෂ ආධිපත්‍ය සහිත දේශපාලන ක්‍රම සඳහා වඩාත් යෝග්‍ය ආණ්ඩුක්‍රමයක් ලෙස පොදුවේ පිළිගනු ලබයි.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ඒකතන්ත්‍ර ආණ්ඩුක්‍රමය
   A - ස්වයංව පත්වූ පාලකයකු විසින් රාජ්‍ය බලය ක්‍රියාවට නංවන ආණ්ඩුක්‍රමයක් වේ.
   B - සියලු රාජ්‍ය නිලධාරීන් අනුග්‍රාහක පදනම මත පත් කරන්නාවූ ආණ්ඩුක්‍රමයක් වේ.
   C - කතිපයාධිකාරී ප්‍රභූන් විසින් රාජ්‍ය බලය ක්‍රියාවට නංවන ආණ්ඩුක්‍රමයක් වේ.
   D - නිශ්චිත දේශපාලන සහ ආර්ථික දැක්මකින් තොරව රට පාලනය කරන ආණ්ඩුක්‍රමයක් වේ.
   E - ආණ්ඩුකරණය හා සම්බන්ධ කිසිදු කරුණක් පිළිබඳව ජනතාවට හඬක් නොමැති ආණ්ඩුක්‍රමයක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[අනෙක් පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

**12.** ධනවාදය

A - පාරිභෝජන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ විධික්‍රමය මත පදනම් වූ සුවිශේෂී සමාජ-ආර්ථික ක්‍රමයක් වේ.
B - නිෂ්පාදනය සහ බෙදාහැරීම පෞද්ගලික අංශය විසින් පාලනය කරන ආර්ථික ක්‍රමයක් වේ.
C - පෞද්ගලික දේපළ හිමිකාරිත්වය, නිදහස් ව්‍යවසාය සහ විවෘත වෙළඳපොළ යන තෙවැදෑරුම් කුලුනු මත ගොඩනැගී ඇත.
D - පැවැතිය හැක්කේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය සමඟ පමණි.
E - දුප්පතුන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම අරමුණු කරගත් ආර්ථික සහ දේශපාලන ක්‍රමයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**13.** සමාජවාදය

A - මාක්ස් සහ ලෙනින්ගේ ඉගැන්වීම් මත ගොඩනගන ලද දේශපාලන මතවාදයක් වේ.
B - පොදු මානව පැවැත්ම සහ පූර්ණ සමාජ සමානාත්මතාව පිළිබඳ දර්ශනය මත ගොඩනගා ඇත.
C - පන්ති දේශපාලනය සමඟ සමීපව සම්බන්ධ වේ.
D - නිෂ්පාදනය, බෙදාහැරීම සහ හුවමාරුව පිළිබඳ පෞද්ගලික හිමිකාරිත්වයට එකහෙළා විරුද්ධ වේ.
E - නිර්ධන පන්තියේ ආඥාදායකත්වය මත පදනම් වූ කොමියුනිස්ට් සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කරගනී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**14.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදය

A - ප්‍රතිසංස්කරණවාදය නැතහොත් විකාශනාත්මක සමාජවාදය ලෙස ද හැඳින්වේ.
B - ජර්මන් ජාතික සමාජවාදී දේශපාලන න්‍යායවාදියකු වූ එඩුවාඩ් බර්න්ස්ටයින් විසින් ඉදිරිපත් කළ දේශපාලන අදහස් මත විකාශනය වූවක් වේ.
C - රාජ්‍යයේ පූර්ණ පාලනයට ආර්ථිකය යටත් විය යුතුය, යන මාක්ස්ගේ මතවාදයට මුලුමනින්ම පටහැනි වේ.
D - රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහි එකතුවෙන් ගොඩනැගුණු මිශ්‍ර ආර්ථිකයකට අනුබල දක්වන න්‍යායක් වේ.
E - සමාජ වෙනස්කම් උදෙසා ඡන්දයට වඩා උණ්ඩයේ වැදගත්කම විශ්වාස කරනු ලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**15.** නීතියේ ආධිපත්‍යය

A - නීතියේ උත්තරීතරභාවය අවධාරණය කරන න්‍යාය වේ.
B - නීතිය ඉදිරියේ සමානාත්මතාව සහ සියලු දෙනාටම නීතියේ සමාන ආරක්ෂාව පිළිබඳ අදහස අවධාරණය කරන න්‍යාය වේ.
C - කැබිනට් ආණ්ඩුක්‍රමය යටතේ පමණක් පවත්වා ගෙන යා හැකි යැයි විශ්වාස කෙරේ.
D - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍ය මූලිකාංගයක් ලෙස සැලකේ.
E - සාධනීකරණය කරගැනීමට නම් පාලකයන් මෙන්ම පාලිතයින් ද එකසේ ගරු කිරීම අවශ්‍ය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **16** සිට **21** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**16.** බලතල බෙදීමේ න්‍යාය අවධාරණය කරන්නේ

(1) ආණ්ඩුවේ බලතල ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ වශයෙන් අංශ තුනකට බෙදිය යුතු බව ය.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය යන අංශ තුන එකිනෙකින් වෙන්වන පරිදි ස්වාධීනව සංවිධානය කළ යුතු බව ය.
(3) ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය හැසිරවිය යුත්තේ ස්වාධීන ආයතන හෝ පුද්ගලයින් විසින් බව ය.
(4) පුද්ගල නිදහස ආරක්ෂා කිරීම සඳහා බලතල බෙදීම අත්‍යවශ්‍යම බව ය.
(5) බලතල බෙදා වෙන් කිරීමේදී විධායකයට ප්‍රමුඛත්වය දිය යුතු බව ය.

**17.** නූතන ආණ්ඩුක්‍රමවල ව්‍යවස්ථාදායකය

(1) එක් මණ්ඩලයකින් හෝ මණ්ඩල දෙකකින් සමන්විත වේ.
(2) තෝරා පත්කරන නියෝජිතයන්ගෙන් පමණක් හෝ එසේත් නැතහොත් තෝරා පත්කරන සහ නම් කිරීමෙන් පත්කරන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.
(3) ප්‍රධාන නීති සම්පාදකයා, රාජ්‍ය මුදල් පසුම්බිය ආරක්ෂා කරන්නා සහ විධායකය අධීක්ෂණය කරන ප්‍රධානියා ලෙස ක්‍රියා කරන්නේ ය.
(4) ප්‍රතිපත්ති සම්පාදනයේ නිදහස් හිමිකම, ප්‍රතිපත්ති සම්පාදනයට බලපෑම් කිරීමට පමණක් හැකියාව ඇති සහ විධායක ආධිපත්‍යයට යටත් යන ත්‍රිත්ව ආකෘතින්වලින් යුක්ත වේ.
(5) යුද්ධය සහ සාමය ප්‍රකාශ කිරීමේ අනන්‍ය වූ අයිතිය බුක්ති විඳී.

**18.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ විධායකය

(1) ජනාධිපති හෝ කැබිනට් හෝ ඒ දෙකෙහි මිශ්‍රණයෙන් හෝ ගොඩනැගුණු ද්විත්ව එකක් විය හැකි ය.
(2) එක් පුද්ගලයකුගෙන් හෝ පුද්ගලයින් සංඛ්‍යාවකගෙන් හෝ සමන්විත විය හැකි ය.
(3) නීති විනිශ්චය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරනු ලැබේ.
(4) අධිකාරී බලය සහිත රාජ්‍යයේ වටිනාකම් බෙදා හැරීම තීරණය කරයි.
(5) සිවිල් සේවය, පොලිසිය සහ හමුදාව යන හස්ත මගින් තම කාර්ය ක්‍රියාත්මක කරයි.

[ඉහරවැනි පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

**19.** නූතන ආණ්ඩුක්‍රම තුළ අධිකරණය

(1) ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ ප්‍රධාන සුපරීක්ෂකයාගේ කාර්යය ඉටු කරනු ලැබේ.
(2) දේශපාලන ක්‍රමයේ නීති විනිශ්චය කිරීමේ ප්‍රධාන තීරකයාගේ භූමිකාව ඉටු කරනු ලැබේ.
(3) ඉල්ලා සිටින අවස්ථාවලදී විධායකයට නීති උපදෙස් සැපයීම කරනු ලැබේ.
(4) නීති අර්ථකථනය කිරීමේ කාර්යය කරනු ලැබේ.
(5) මූලික නීතියෙන් පවරා ඇති විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ජනතාවගේ අයිතිවාසිකම්වල උත්තරීතර ආරක්ෂකයා ලෙස ක්‍රියා කරනු ලැබේ.

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(1) ආණ්ඩුක්‍රමයේ මූලික නෛතික රාමුව විදහා දක්වනු ලැබේ.
(2) දේශපාලන ක්‍රීඩාව සිදු කිරීමේ ක්‍රම සහ විධිවලට සම්බන්ධ මූලික නීති නිරූපණය කරනු ලැබේ.
(3) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාවන්ට අදාළ නීති විස්තර කරනු ලැබේ.
(4) ආණ්ඩුවේ බලය සහ කාර්යවලට අදාළ මූලික බාධක සහ සීමා විදහා දක්වනු ලැබේ.
(5) රාජ්‍යය විසින් ආරක්ෂා කළ යුතු ජාතික උරුමයන් හා සම්බන්ධ වැදගත් ස්ථාන පැහැදිලි කරයි.

**21.** දේශපාලන පක්ෂ

(1) දේශපාලන ක්‍රීඩාවේ නියුක්ත ප්‍රධාන ක්‍රීඩකයින් වන්නේ ය.
(2) දේශපාලන ක්‍රමවල ප්‍රජාතන්ත්‍රවාදීභාවය මැනීමේ වැදගත් දර්ශකයක් වන්නේ ය.
(3) මහජන මතය ඒකරාශී කිරීමේ ප්‍රධාන නියෝජිතයින් වන්නේ ය.
(4) සමාජ ප්‍රභූන්ගේ වරප්‍රසාද ආරක්ෂාකොට පවත්වාගෙන යාමට පිහිටුවා ඇති සංවිධාන වන්නේ ය.
(5) සමාජ ප්‍රතිසංස්කරණයේ ප්‍රමුඛ නියෝජිතයින් වන්නේ ය.

- අංක **22** සිට **26** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් ප්‍රකාශ **හතරක්** සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**22.** බලපෑම් කණ්ඩායම්

A - පෞද්ගලික ආශාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා සංවිධානය කරනු ලබන ජනතා සංගම් වේ.
B - ඒකාධිකාරී දේශපාලන ක්‍රම තුළ ද ක්‍රියාත්මක වීමේ පූර්ණ නිදහස බුක්ති විඳී.
C - සාවද්‍ය සහ පදනම් විරහිත තොරතුරු සැපයීම මගින් ආණ්ඩු නොමග යැවීමේ චෝදනාවට බොහෝ විට ලක් වේ.
D - ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථක ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස නොසැලකේ.
E - තම ආශාවන් ප්‍රවර්ධනය කිරීම හා ළඟාකර ගැනීම උදෙසා ප්‍රචණ්ඩකාරී මාර්ග භාවිත කරන රහසිගත සංවිධාන වර්ගයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**23.** අන්තර්ජාතික දේශපාලනය

A - මහා බලවතුන් අතර කෙරෙන්නාවූ දේශපාලනය වේ.
B - මහා බලවතුන් හා අනෙකුත් රාජ්‍ය අතර කෙරෙන්නාවූ දේශපාලනය වේ.
C - රාජ්‍යයන් සහ අන්තර්ජාතික ත්‍රස්තවාදී කණ්ඩායම් අතර කෙරෙන්නාවූ දේශපාලනය වේ.
D - රාජ්‍යයන් සහ ජාත්‍යන්තර සංවිධාන අතර කෙරෙන්නාවූ දේශපාලනය වේ.
E - නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**24.** රාජ්‍ය ප්‍රතිපත්ති

A - ජාතික ආර්ථිකයේ ප්‍රවර්ධනය උදෙසා ආණ්ඩුවේ අනුමැතිය සහිතව පෞද්ගලික අංශය විසින් ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති වේ.
B - ජාතික සුභසාධනය වර්ධනය කිරීම උදෙසා ආණ්ඩුවේ උපදෙස් සහිතව සිවිල් සමාජය විසින් ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති වේ.
C - සාමාජිකයින් අතර සහයෝගිතාව වර්ධනය කිරීම උදෙසා අන්තර් ආණ්ඩු සංවිධාන විසින් තම සාමාජිකයින්ට නිර්දේශ කරන ප්‍රතිපත්ති වේ.
D - 'රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම' මාතෘකාව යටතේ සමහර රටවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද ප්‍රතිපත්ති වේ.
E - ප්‍රවේශමෙන් තෝරාගත්, සුවිශේෂී අරමුණු ළඟා කරගැනීමට ආණ්ඩු විසින් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**25.** සමාජ ගැටුම්

A - සමාජ කණ්ඩායම් අතර බලය සහ ආර්ථික සම්පත් අසමාන ලෙස බෙදීයාමේ අවසාන ප්‍රතිඵලය වේ.
B - අන්තර්ජාතික සමාජය තුළ බලය බෙදීයාම සම්බන්ධයෙන් රාජ්‍යයන් තුළ ඇතිවන අතෘප්තිමත්භාවයේ ප්‍රතිඵලයක් වේ.
C - සන්ධීය ආණ්ඩුක්‍රමයක් තුළ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ආණ්ඩු අතර ඇතිවන නොඑකඟතාවන්ගේ ප්‍රතිඵලය වේ.
D - තම අනන්‍යතාවලට තර්ජනයක් තොමැති යැයි ඇතිවෙන කණ්ඩායම් හැඟීම්වල ප්‍රතිඵලය වේ.
E - හූනියම් සහ මායාකර්ම පිළිබඳව ජනතාව තුළ පවත්නා අන්ධ විශ්වාසවල ප්‍රතිඵලය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[පස්වැනි පිටුව බලන්න.

www.alpanthiya.lk

**26.** තෝරාගත් රටවල ආණ්ඩුක්‍රමයන්හි දේශපාලන විධායකය:

A - ඉන්දියාවේ කැබිනට් මණ්ඩලය නමින් හඳුන්වන දේශපාලන විධායකය සමන්විත වන්නේ රාජ්‍ය සභාව තුළින් තෝරා ගන්නා නියෝජිතයන්ගෙන් පමණි.

B - කැබිනට් මණ්ඩලය නමින් හඳුන්වන මහා බ්‍රිතාන්‍යයේ දේශපාලන විධායකයේ නායකත්වය දරන්නේ රැජින විසිනි.

C - ප්‍රංශයේ පවතින දෙමුහුන් විධායකයේ පාර්ශ්ව දෙකම සමාන තත්ත්වයක් හා බලයක් භුක්ති විඳී.

D - සාමූහික විධායකය නමින් හඳුන්වන ස්විට්සර්ලන්තයේ දේශපාලන විධායකය කැන්ටන්වලින් තෝරාපත්කර ගන්නා නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

E - ජනාධිපති ලෙස හැඳින්වෙන ඇමෙරිකා එක්සත් ජනපදයේ විධායකය වසර හතරක් සඳහා ඡන්ද විද්‍යාලයකින් තෝරා පත්කර ගනී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **27** සිට **39** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් ඉදිරිපත් කර ඇත. ඒවායින් නිවැරදි වන්නේ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**27.** 1833 දී හඳුන්වා දුන් කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණවල ඇතැම් දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක:

A - නිදහස් ශ්‍රම වෙළඳපොළ බිහිවීම

B - ඒකීය පරිපාලන ක්‍රමයක් සහ නීති ක්‍රමයක් වර්ධනය වීම

C - ධනවාදී ආර්ථික ක්‍රමයේ නැගී ඒම

D - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ආරම්භ වීම

E - කුල වෙනස්කම් උග්‍රවීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**28.** බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ සමහර අහිතකර දේශපාලන හා සමාජ-ආර්ථික ප්‍රතිවිපාක:

A - ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකයේ බිඳ වැටීම

B - දේශීය මධ්‍යම පන්තියක් බිහි වීම

C - වාණිජ වතු වගාව හඳුන්වා දීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ඉඩම් ප්‍රශ්නය ඉස්මතු වීම

D - ඉංග්‍රීසි භාෂාව උගත් සහ නූගත් වශයෙන් සමාජය නව රේඛාවකින් ඛණ්ඩනය වීම

E - නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල සමාජ-ආර්ථික සංවර්ධනයේ අසමතුලිතභාවය අවම වීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**29.** ලංකාවේ ජාතික ව්‍යාපාරයේ කැපීපෙනෙන ලක්ෂණ:

A - පුළුල් ජනතා සහභාගිත්වය

B - ප්‍රභූ නායකත්වය

C - කොමියුනිස්ට් විරෝධී ස්ථාවරය

D - අරමුණු සහ අපේක්ෂා පිළිබඳව නායකයන් අතර පැවති අසමගිය

E - අසීමිත සාමකාමීභාවය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**30.** 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ:

A - ව්‍යවස්ථාදායක කාර්ය සඳහා ස්ථාපිත කළ මන්ත්‍රීවරුන් 61 දෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය මන්ත්‍රණ සභාව

B - විධායක කාර්ය ඒකාබද්ධව ක්‍රියාවට නැංවීමට ස්ථාපිත කළ අමාත්‍ය මණ්ඩලය සහ විධායක කාරක සභා

C - දේශපාලන අර්බුදවලට මැදිහත් වීමෙන් ඇත් කරන ලද ආණ්ඩුකාරවරයා

D - ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් යටතේ සංවිධානය කරන ලද සිවිල් සේවාව

E - මහජන පරමාධිපත්‍යය පදනම් කරගත් ආණ්ඩුකරණය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**31.** 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A - ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කළේ ය.

B - කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේ ය.

C - ලංකාවේ ආණ්ඩුවට විදේශ සම්බන්ධතා මෙහෙයවීමට අවශ්‍ය පූර්ණ නිදහස සහ අධිකාරිත්වය ලබා දුන්නේ ය.

D - ආණ්ඩුව සම්බන්ධව බ්‍රිතාන්‍ය කිරීටයේ නායකත්වය පවත්වා ගත්තේ ය.

E - සුළුතර අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට විශේෂිත ව්‍යවස්ථාමය ආරක්ෂණ විධිවිධාන යොදන ලද්දේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

A/L පන්තිය
www.alpanthiya.lk

**32.** 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ සෙනෙට් මණ්ඩලය
A - සාමාන්‍යයෙන් ඉහළ මණ්ඩලය ලෙස ද හැඳින්විනි.
B - පාර්ලිමේන්තුවේ ප්‍රධාන පක්ෂ දෙකෙන් තෝරා පත්කළ සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත විය.
C - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ආධිපත්‍යයට එරෙහිව නිවර්තක කාර්යභාරයක් ඉටු කිරීම අපේක්ෂා කරන ලදී.
D - මුල්‍ය කෙටුම්පත් ආරම්භ කිරීමේ බලය භුක්ති නොවින්දේ ය.
E - ස්ථිර මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම අපේක්ෂා කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**33.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ:
A - දේශජ හෙවත් සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකික නිර්මාණයක් වීම
B - ජාතික රාජ්‍ය සභාවේ නීතිමය උත්තරීතරත්වය
C - පාර්ලිමේන්තු විධායකය හෙවත් කැබිනට් ආණ්ඩුක්‍රමය
D - යම් ප්‍රමාණයකට දුර්වල කරන ලද අධිකරණය
E - උල්ලංඝනය වූ විට අධිකරණ ක්‍රියාමාර්ග ගතහැකි මූලික අයිතිවාසිකම් සහ නිදහස පිළිබඳ පරිච්ඡේදය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**34.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ජාතික රාජ්‍ය සභාව
A - ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.
B - ජනතාව විසින් තෝරා පත්කරගත් නියෝජිතයින්ගෙන් පමණක් සමන්විත විය.
C - පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය මූලධර්මය මත ස්ථාපිත කෙරිණි.
D - බලය සහ තත්ත්වය අතින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති පාර්ලිමේන්තුවට බෙහෙවින්ම සමාන විය.
E - ව්‍යවස්ථාවෙන් දක්වා තිබූ සය වසරක නිලකාලය භුක්ති විඳීමේ හිමිකම පවරා තිබුණි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**35.** 1978 දී ස්ථාපිත කළ දෙවන ජනරජ ව්‍යවස්ථාව
A - ඇමෙරිකාවේ ජනාධිපති ක්‍රමයට බොහෝදුරට සමාන ජනාධිපති ක්‍රමයක් හඳුන්වා දුන්නේ ය.
B - පාර්ලිමේන්තුව නමින් හඳුන්වන ආංශික ව්‍යවස්ථාදායක බලයක් සහිත ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කළේ ය.
C - ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය යන අධිකරණ දෙකෙන් සමන්විත ඉහළ උසාවි ක්‍රමයක් ස්ථාපිත කළේ ය.
D - සිවිල් සේවාවේ ස්වාධීනත්වය තහවුරු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නැවත බල ගැන්වූයේ ය.
E - ජනාධිපති සහ කැබිනට් මණ්ඩලයකින් සමන්විත දෙමුහුන් විධායක ක්‍රමයක් සංස්ථාපනය කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**36.** 1978 ව්‍යවස්ථාවෙන් නිර්මාණය කළ ජනාධිපති තනතුරෙහි ආරම්භක ස්වරූපය:
A - රාජ්‍යයේ, විධායකයේ, ආණ්ඩුවේ නායකයා මෙන්ම හමුදාවල සේනාධිනායකයා ද වීම
B - ආණ්ඩුවේ විධායක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය වීම
C - වසර හයක් සඳහා ජනතාව විසින් සෘජුවම තෝරා පත්කරගැනීම
D - පාර්ලිමේන්තුව විසින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් තනතුරෙන් ඉවත් කළ හැකි වීම
E - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට ආවරණය වී නිර්මාණය කළ ආඥාදායක තනතුරක් වීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**37.** 2001 දී සිදු කළ 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ මූලික වෙනස්කම්:
A - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපිත කිරීම
B - රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිෂන් සභාවලට අමතර බලතල පැවරීම
C - පරිපාලන අභියාචනා විනිශ්චය සභාව හඳුන්වා දීම
D - ජාතික පොලිස් කොමිසම සහ මැතිවරණ කොමිසම ස්ථාපිත කිරීම
E - පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා ක්‍රියාත්මක කළ සියලු බලතල අහෝසි කිරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

**38.** 2010 දී ක්‍රියාවට නැගූ 18 වන සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කළ වෙනස්කම්:
A - පරිපාලනය සඳහා වූ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය අහෝසි කිරීම
B - එක් පුද්ගලයකුට ජනාධිපති තනතුරට තේරී පත්විය හැකි වාර දෙකේ සීමාව ඉවත් කිරීම
C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අවලංගුකොට පාර්ලිමේන්තු සභාව ස්ථාපිත කිරීම
D - රාජ්‍ය සේවා, පොලිස් සහ මැතිවරණ කොමිෂන් සභාවලට පැවරී තිබූ සමහර බලතල සීමා කිරීම
E - ජනාධිපතිවරයාට සෑම මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට පැමිණීමට හැකි වන ලෙස විධිවිධාන සැකසීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

[ හත්වැනි පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

**39.** 2015 දී සිදු කළ 19 වන සංශෝධනය යටතේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක්කළ මූලික වෙනස්කම් කිහිපයක්:
A - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ප්‍රතිෂ්ඨාපනය කිරීම
B - ජනාධිපති තනතුර දැරීම සම්බන්ධ වාර දෙකේ කොන්දේසිය නැවත පැනවීම
C - ජනාධිපති තනතුරේ නිලකාලය වසර හයේ සිට වසර පහ දක්වා අඩු කිරීම
D - පාර්ලිමේන්තුවේ නිලකාලය වසර හයේ සිට වසර පහ දක්වා අඩු කිරීම
E - පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි පූර්ව අධිකරණ නිරීක්ෂණ බලය ඉවත් කිරීම

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- පහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ 1978ට පෙර පැවති සහ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ ක්‍රම දෙකට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ අදාළ කරගෙන අංක **40** සහ **41** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - හොඳියුණු දේශපාලන සංස්කෘතියක් සහිත රටකට වඩාත් යෝග්‍ය වේ.
B - පළමුව දිනුම් කණුව පසුකරන්නා යන මූලධර්මය මත ජයග්‍රාහී අපේක්ෂකයා තෝරා ගනී.
C - මැතිවරණ දිස්ත්‍රික්ක පදනම මත මැතිවරණ පැවැත්වේ.
D - සුළු ජාතීන්ට වඩාත් වාසිදායක යැයි සැලකේ.
E - තනිමන්ත්‍රී ඡන්ද කොට්ඨාස හෝ බහුමන්ත්‍රී ඡන්ද කොට්ඨාසවලින් මැතිවරණ ආසන සමන්විත විය හැකි ය.
F - ලැයිස්තු පදනමින් හෝ මනාප ඡන්ද ක්‍රමය මත මැතිවරණ පැවැත්වේ.
G - පුරප්පාඩු සිදු වූ විට අතුරු මැතිවරණ පවත්වයි.
H - ගණනය කිරීමේ දී ඡන්දවලට හිමි වන්නේ අසමාන වටිනාකමකි.
I - ඡන්ද අපතේ යෑම සැලකිය යුතු ඉහළ මට්ටමක පවතී.
J - පක්ෂ නායකත්වයේ කර්තෘපයාධිකාරී බලය වර්ධනය වීමට විශාල වශයෙන් දායක වේ.

**40.** සරල බහුතර නියෝජන ක්‍රමයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ABCD (2) EFGH (3) ABIJ (4) BEGI (5) EFGH

**41.** සමානුපාතික නියෝජන ක්‍රමයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ACDE (2) BGHI (3) CDFJ (4) CFHJ (5) BDGJ

- අංක **42** සිට **46** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට අදාළ ප්‍රකාශ පහක් සපයා ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**42.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය
(1) ජනරජයේ ඇති අවසාන සහ උත්තරීතර ලේඛනෝපගත කිරීමේ අධිකරණය වේ.
(2) අග්‍ර විනිශ්චයකාරවරයා සහ හයදෙනෙකුට නොඅඩු දසදෙනෙකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත වේ.
(3) ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ එකම සහ පරම අධිකරණ බලය දරන්නා වේ.
(4) මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම විභාග කිරීමේ එකම සහ පරම අධිකරණ බලය දරන්නා වේ.
(5) එයට පවරා ඇති කාරණාවලට අදාළ අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකිව යුතු වේ.

**43.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව
(1) 2001 දී 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළමුව හඳුන්වා දීම සහ ස්ථාපිත කිරීම සිදු කරන ලදී.
(2) 2010 දී 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ අහෝසි කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු සභාව පිහිටුවන ලදී.
(3) 2015 දී 19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ නැවත පිහිටුවන ලදී.
(4) ආරම්භයේ දී ජනාධිපති උපදේශන මණ්ඩලයක් ලෙස කටයුතු කිරීමේ කාර්ය පමණක් පවරා තිබුණි.
(5) පරිපාලන සහ අධිකරණ පත්කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිගේ බලතලවලට සංවරණයක් ලෙස ක්‍රියාත්මක වීමට පිහිටුවන ලදී.

**44.** ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය
(1) බහුපක්ෂ ක්‍රමයකි.
(2) ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක ආධිපත්‍යය සහිත බහුපක්ෂ ක්‍රමයකි.
(3) ධනවාදී, සමාජවාදී සහ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂවලින් සමන්විත බහු පක්ෂ ක්‍රමයකි.
(4) වාර්ගිකත්ව කාරණාව මත්සේ සංවිධානය වී ඇති සමහර පක්ෂ සහිත බහුපක්ෂ ක්‍රමයකි.
(5) කේඩර පක්ෂවලින් පමණක් සමන්විත බහුපක්ෂ ක්‍රමයකි.

A/L පන්තිය
www.alpanthiya.lk

**45.** පළාත් සභාවල ආණ්ඩුකාරයා
(1) ජනාධිපති විසින් පත්කරනු ලැබේ.
(2) පළාත් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වේ.
(3) නිලයේ දිවුරුම් දුන් දිනයේ සිට තනතුරේ අවුරුදු 05ක නිලකාලයක් භුක්ති විඳීමේ හිමිකම ඇත.
(4) ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත පළාත් සභාව කැඳවීමට, කල්තැබීමට සහ විසුරුවා හැරීමට බලය පවරා ඇත.
(5) පළාත් සභාව විසින් සරල බහුතර ඡන්දයකින් සම්මත කරන විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කිරීමට යටත් වේ.

**46.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන
(1) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වශයෙන් වර්ග තුනකින් යුක්ත වේ.
(2) එක් අඩක් තෝරාපත් කර ගැනීමෙන් ද, අනෙක් අඩ පත්කිරීමෙන් ද සැකසුණු සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
(3) තම බලප්‍රදේශය තුළ ප්‍රජා ප්‍රයෝජ්‍යතා සේවා සැපයීම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.
(4) මධ්‍යම ආණ්ඩුවේ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.
(5) ස්වාධීන සහ ස්වාධිපති ආයතන නොවේ.

● පහතින් දැක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයට සහ පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ යොදා ගනිමින් අංක **47** සහ **48** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - උතුරු අත්ලාන්තික ගිවිසුම් සංවිධානයට අනුබද්ධ ආයතනයකි.
B - ක්‍රමානුකූල විකාශනය මත ගොඩනැගුණු වර්තමාන ලෝකයේ පවත්නා එකම අන්තර් ආණ්ඩු සංවිධානයයි.
C - 1945 දී ස්ථාපිත කළ විශ්වීය අන්තර් ආණ්ඩු සංවිධානයකි.
D - සීමිත අරමුණු සහිත මැද මට්ටමේ අන්තර් ආණ්ඩු සංවිධානයකි.
E - ප්‍රධාන ආයතන හයකින් සමන්විත ය.
F - බැඳීම් සහිත ඡන්ද මත ක්‍රියාත්මක වනවාට වඩා, කැමැත්ත සහ පෙලඹවීම මත ක්‍රියාත්මක වේ.
G - වසරක් හැර වසරක රැස්වීම් පැවැත්වේ.
H - ප්‍රධාන සාකච්ඡා සභාව මහා මණ්ඩලයයි.
I - අන්තර්ජාතික සාමය සහ සුරක්ෂිතතාව පවත්වාගෙන යාම මූලික අරමුණ වේ.
J - බ්‍රිතාන්‍ය රැජිනගේ අනුග්‍රහය යටතේ සෑම වර්ෂයකම රැස්වීම් පවත්වයි.

**47.** එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ACDE (2) BGHI (3) CDFJ (4) CEHI (5) BDFJ

**48.** පොදු රාජ්‍ය මණ්ඩලයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ACDE (2) CEHI (3) CDFJ (4) CFHJ (5) BDFJ

● පහතින් දැක්වෙන්නේ දකුණු ආසියානු සහයෝගිතාව සඳහා වූ කලාපීය සංවිධානය සහ අන්තර්ජාතික රතු කුරුස කමිටුවට අදාළ ප්‍රකාශ කිහිපයකි. එම ප්‍රකාශ යොදා ගනිමින් අංක **49** සහ **50** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ඪකා ප්‍රකාශනය අත්සන් කරමින් දකුණු ආසියානු රාජ්‍යයන් හතක් විසින් 1985 දී පිහිටුවන ලදී.
B - මානව හිතවාදී අන්තර්ජාතික නීතිය ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ රාජ්‍ය නොවන ස්වේච්ඡා සංවිධානයකි.
C - සීමිත අරමුණු සහිත කලාපීය අන්තර් රාජ්‍ය සංවිධානයකි.
D - ජාත්‍යන්තර මානව හිමිකම් කවුන්සිලයට අනුබද්ධ එක් උපදේශක මණ්ඩලයකි.
E - සන්නද්ධ ගැටුම්වල බලපෑමට ලක්වූ හමුදා පිරිස් සහ සිවිල් පුද්ගලයන්ගේ සුබසාධනය සැලකිලිමත් වන ප්‍රධාන කරුණ වේ.
F - සාමාජික රටවල විදේශ අමාත්‍යවරුන්ගේ වාර්ෂික රැස්වීම, තීරණ ගැනීමේ ඉහළම ආයතනය වේ.
G - මනුෂ්‍යත්වය, අපක්ෂපාතිත්වය, ස්වාධීනත්වය, ස්වේච්ඡාත්මකභාවය සහ විශ්වීය බව යන මූලධර්ම මත කටයුතු කරයි.
H - ද්විපාර්ශ්වික සහ මතභේදාත්මක කරුණු සාකච්ඡා කිරීම ප්‍රඥප්තිය මගින්ම තහනම් කොට ඇත.
I - සාමාජික රටවල් අතර පවත්නා විවිධ ගැටුම් නිසා ප්‍රගතිය ඉතා මන්දගාමී වේ.
J - මානවහිතවාදී ක්‍රියාකාරකම්වල නියැලෙන ස්වේච්ඡා සංවිධානයකි.

**49.** කලාපීය සහයෝගිතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානයට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ACHI (2) BGHI (3) CDFJ (4) CFHJ (5) BDGJ

**50.** අන්තර්ජාතික රතු කුරුස කමිටුවට අදාළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
(1) ACDE (2) BGHI (3) CDFJ (4) BEGJ (5) BDGJ

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

www.alpanthiya.lk

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

**23 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය: ....................................

| A කොටස | |
|---|---|
| මුළු ලකුණු | 20 |

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් **තුනකින්** යුක්ත ය.
* **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

1. "දේශපාලනය යනු බලය සඳහා කරන අරගලයයි." එම අරගලය ක්‍රම දෙකකට කරනු ලැබේ. එම ක්‍රම **දෙක** නම් කරන්න.

   (1) ..................................................................

   (2) ..................................................................

2. මිනිසා විවිධ මාර්ග ඇසුරෙන් දේශපාලනය ඉගෙනගනී. පුළුල් පදනමක් මත ඒවා ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ග කෙරේ. එම කාණ්ඩ **දෙක** නම් කරන්න.

   (1) ..................................................................

   (2) ..................................................................

3. පහත සඳහන් ප්‍රකාශ දෙක මගින් දේශපාලන විද්‍යාව හැදෑරීමේ ප්‍රවේශ දෙකක සමහර ලක්ෂණ විදහා දක්වනු ලැබේ. එම ප්‍රවේශ **දෙක** නම් කරන්න.

   (i) "එය පුද්ගලයින් සහ සමාජ කණ්ඩායම්වල චර්යාව ප්‍රත්‍යක්ෂමූලිකව විශ්ලේෂණය කිරීම පිළිබඳව අවධානය යොමු කරයි. එමගින් සමාජ මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව සහ සංස්කෘතික මානවවිද්‍යාව හා අදාළ න්‍යාය සහ පර්යේෂණ ඒකාබද්ධ කිරීමට උත්සාහ කරයි. න්‍යාය සහ පර්යේෂණ අතර අන්තර් රඳාපැවැත්ම එමගින් අවධාරණය කෙරේ. එය ගැඹුරු ප්‍රත්‍යක්ෂමූලික පර්යේෂණ ක්‍රමවේදයක් සංවර්ධනය කිරීමට උත්සාහ කරයි. එය අගයකිරීම්වලින් තොර හැදෑරීම් අවධාරණය කරනු ලැබේ."

   (ii) "එය ස්වභාවයෙන්ම සමපේක්ෂණ හා නිගාමී වේ. එය යම් යම් උපකල්පන මත ආරම්භ කරන අතර ඒවා වඩාත් හොඳින් යථාර්ථීකරණය කරගැනීමට හැකි ආයතන තීරණය කරයි. එමගින් ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ පැවතිය යුත්තේ කුමක් ද යන්න ගැන මිස, සැබෑ ලෝකයේ සත්‍ය වශයෙන්ම පවතින්නේ කුමක් ද යන්න ගැන නොවේ."

   (1) ..................................................................

   (2) ..................................................................

4. රාජ්‍යයේ සම්භවය හා සම්බන්ධ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ. ඒවා හඳුනාගෙන නම් කරන්න.

   (i) "රාජ්‍යය යනු සෙමින් සහ අඛණ්ඩව සිදු වූ ඓතිහාසික වර්ධනයක ප්‍රතිඵලයකි."

   (ii) "රාජ්‍යය යනු ප්‍රකෘති සමාජයක ජීවත් වූ මිනිසුන් විසින් එළඹෙන ලද සම්මුතියක ප්‍රතිඵලයකි."

   (1) ..................................................................

   (2) ..................................................................

[දෙවැනි පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

5. "මිනිසාගේ භෞතික පැවැත්ම එකිනෙකට වෙනස් මූලයන් දෙකකින් ප්‍රභවය වන බලවේග දෙකක් මගින් හැසිරවීම සහ පාලනය කිරීම කරනු ලැබේ." එම මූලයන් **දෙක** හඳුනාගෙන නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

6. පහත දැක්වෙන අංක (i) ප්‍රකාශය සහ අංක (ii) ප්‍රකාශය මගින් අර්ථ ගැන්වෙන්නේ කුමක් දැයි හඳුනාගෙන ඒවා නම් කරන්න.

(i) "සවිඥානික හෝ අවිඥානිකව මෙන්ම පැහැදිලිව සහ අපැහැදිලිව වුවද දේශපාලනය පිළිබඳ ගොඩනගා ගන්නා ආකල්ප, අගය කිරීම් සහ විශ්වාස පද්ධතිය."

(ii) "පුද්ගලයින් තම දේශපාලන අගය කිරීම්, ආකල්ප සහ පුරුදු ඇතිකරගැනීමේ ක්‍රියාදාමය."

(1) ....................................................................................................

(2) ....................................................................................................

7. (i) ජනාධිපති ආණ්ඩුක්‍රමය තුළ නිලකාලය අවසන් වීමට ප්‍රථමයෙන් දේශපාලන විධායකය තනතුරින් ඉවත් කිරීමට අනුගමනය කරන ව්‍යවස්ථාමය ක්‍රියාදාමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ii) කැබිනට් මණ්ඩලය නමින් ද හැඳින්වෙන කැබිනට් ආණ්ඩුක්‍රමයේ දේශපාලන විධායකය නිලකාලය අවසන් වීමට පෙර තනතුරින් ඉවත් කිරීමට අනුගමනය කරන ක්‍රියාදාමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

8. පහත දැක්වෙන අංක (i) ප්‍රකාශය සහ අංක (ii) ප්‍රකාශය මගින් අර්ථවත් වන ආණ්ඩුවේ අංග **දෙක** හඳුනාගෙන නම් කරන්න.

(i) ආණ්ඩුවේ කාර්යයන් ආරම්භ කිරීම, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍යයේ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම හා සම්බන්ධ මූලික වගකීම හිමි අංගය

(ii) පනත් කෙටුම්පත් සාකච්ඡා කිරීම, සම්මත කිරීම සහ විධායකයේ ක්‍රියාකාරීත්වය සුපරීක්ෂා කිරීම පිළිබඳව මූලික වගකීම හිමි අංගය

(1) ....................................................................................................

(2) ....................................................................................................

9. (i) ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ නිල නාමය කුමක් ද?

(ii) ඉන්දියානු මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලය හඳුන්වන නිල නාමය කුමක් ද?

(1) ....................................................................................................

(2) ....................................................................................................

10. පහත දැක්වෙන අංක (i) ප්‍රකාශයෙන් සහ අංක (ii) ප්‍රකාශයෙන් අදහස් කරන්නේ කුමක් ද?

(i) රාජ්‍යයේ වගකීම් සහ කාර්යයන් ඉටුකිරීම සඳහා සේවයේ යොදවා ඇති සිවිල් නිලධාරී මණ්ඩලය

(ii) අධිකාරී බලය පදනම් කරගෙන නීතිය අර්ථකථනය කිරීමේ සහ සුවිශේෂී නඩුකටයුතු සඳහා එය යොදාගැනීමේ ප්‍රධාන වගකීම පැවරී ඇති ආණ්ඩුවේ ආයතනය

(1) ....................................................................................................

(2) ....................................................................................................

11. පොදුවේ පිළිගන්නා ආකාරයට කෝල්බෲක් කැමරන් කොමිෂමේ නිර්දේශ ලංකාවේ (1) නිදහස් ශ්‍රම වෙළඳපොළේ සහ (2) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනයට පදනම දමන ලදී. එම නිර්දේශ **දෙක** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

[තුන්වැනි පිටුව බලන්න.

A/L පන්තිය
www.alpanthiya.lk

**12.** (i) 1924 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවල නිර්මාපකයින් කවරහු ද?

(ii) පොදුවේ පිළිගන්නා ආකාරයට 1924 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක වූයේ නැත. 1924 ව්‍යවස්ථාවේ අසාර්ථකත්වයට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

(1) ..............................

(2) ..............................

**13.** (i) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ රාජ්‍ය මන්ත්‍රණ සභාවට ද්විත්ව කාර්යභාරයක් පවරා තිබුණි. එම **ද්විත්ව** කාර්යයන් මොනවා දැයි නම් කරන්න.

(ii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ 'මුර බල්ලන්' ලෙස නම් කළේ කවුරුන් ද?

(1) ..............................

(2) ..............................

**14.** (i) සුළුතරයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සෝල්බරි ව්‍යවස්ථාවට ඇතුළත් කළ වගන්තියේ අංකය කුමක් ද?

(ii) 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ලංකාවේ ස්ථාපිත කළේ කවරාකාර අණ්ඩුක්‍රමයක් ද යන්න නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**15.** (i) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද නාමික විධායකයේ නිල නාමය කුමක් ද?

(ii) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ නාමික විධායකයේ නිල කාලය කොපමණ ද?

(1) ..............................

(2) ..............................

**16.** ජනතා පරමාධිපත්‍ය ක්‍රියාවට නැංවීම සඳහා දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් මාධ්‍යයන් **දෙකක්** දක්වා තිබේ. ඒවා නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**17.** (i) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට එක්කළ 19 වන සංශෝධනය මගින් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය කුමක් ද?

(ii) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට එක්කළ 19 වන සංශෝධනය මගින් පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පාර්ලිමේන්තු නොවන සාමාජිකයන්ගේ සංඛ්‍යාව කොපමණ ද?

(1) ..............................

(2) ..............................

**18.** "ශ්‍රී ලංකාවේ දේශපාලන සංග්‍රාම භූමියේ ආධිපත්‍යය සැමවිටම හිමිකොටගෙන ඇත්තේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් විසිනි." එම පක්ෂ **දෙක** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

**19.** (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ වර්තමාන සංයුතිය කුමක් ද?

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ වර්තමාන සංයුතියේ නිත්‍ය නොවන සාමාජික සංඛ්‍යාව කොපමණ ද?

(1) ..............................

(2) ..............................

**20.** (i) කලාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංවිධානය පිහිටුවන ලද වර්ෂය කුමක් ද?

(ii) කලාපීය සහයෝගිතාව සඳහා වන දකුණු ආසියානු සංවිධානය තීරණ ගැනීමේ දී යොදාගන්නා පදනම් මූලධර්මය කුමක් ද?

(1) ..............................

(2) ..............................

www.alpanthiya.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

**උපදෙස්:**

* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

1. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නේ කෙසේ ද? (ලකුණු 20 යි.)

2. පහත දැක්වෙන ඕනෑම **දෙකක්** විභාග කරන්න.
   (i) පන්ති අරගලයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය
   (ii) සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය
   (iii) සමාජ විකාශනයක ප්‍රතිඵලයක් ලෙස රාජ්‍යය (ලකුණු 10 × 2 = 20 යි.)

3. පහත දැක්වෙන ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අත්‍යවශ්‍ය මූලිකාංග
   (ii) ඒකීය සහ සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අතර ඇති වෙනස්කම්
   (iii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වාසි සහ අවාසි (ලකුණු 10 × 2 = 20 යි.)

4. පහත දැක්වෙන ඕනෑම **දෙකක්** විභාග කරන්න.
   (i) බ්‍රිතාන්‍ය කැබිනට් ක්‍රමයේ විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා
   (ii) ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති තෝරා පත්කර ගන්නා ක්‍රියාදාමය
   (iii) ඉන්දියානු සන්ධීය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ (ලකුණු 10 × 2 = 20 යි.)

## C කොටස

5. කෝල්බෲක්-කැමරන් නිර්දේශවල වාසි සහ අවාසි **හෝ** ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විධායක කාරක සභා ක්‍රමයේ වාසි සහ අවාසි විශ්ලේෂණය කරන්න. (ලකුණු 20 යි.)

6. පහත දැක්වෙන ඕනෑම **දෙකක්** සසඳමින් වෙනස පහදන්න.
   (i) සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ නාමික විධායකයේ බලතල, කාර්යයන් සහ තත්ත්වය
   (ii) සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකයේ නීති සම්පාදන බලය
   (iii) සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය (ලකුණු 10 × 2 = 20 යි.)

7. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ව පහත දැක්වෙන ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) ජනාධිපති තෝරා පත්කර ගැනීමේ ක්‍රමය
   (ii) 18 වැනි සහ 19 වැනි ව්‍යවස්ථා සංශෝධන යටතේ ජනාධිපතිගේ තත්ත්වය
   (iii) ජනාධිපතිවරයා තනතුරෙන් ඉවත් කිරීමේ ක්‍රමවේදය (ලකුණු 10 × 2 = 20 යි.)

8. පහත දැක්වෙන ඕනෑම **දෙකක්** විභාග කරන්න.
   (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු හා මූලධර්ම
   (ii) දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ අරමුණු සහ මූලධර්ම
   (iii) මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ කාර්යභාරය (ලකුණු 10 × 2 = 20 යි.)

* * *